# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/4/6-ප්‍ර.ලේ. චක්‍රලේඛ | ඔබේ අංකය / உனது இல. / Your Ref. | දිනය / திகதி / Date: 2022.05. 30 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (සංවර්ධන)- 1/2022

දකුණු පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

<u>රජයේ ඉඩම් සංවර්ධන කාර්ය සඳහා ප්‍රශස්ථ ලෙස යෙදවීම මගින් ජාතික ආර්ථිකය සංවර්ධනය සඳහා දායක වීම.</u>

දැනටමත් රජය මගින් බෙදා දී ඇති දීමනා පත්‍ර ඉඩම් කැබලි වලට අමතරව දීමනා පත්‍ර ලබා දී නොමැති බලපත්‍ර ඉඩම් කැබලි ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක් දකුණු පළාත තුල ඇති බවට ගණන් බලා ඇත. මෙම බලපත්‍ර ඉඩම් සහ රජයට අයත් ජනතාවට බෙදා දීමට හෝ සංවර්ධන කාර්යයක් සඳහා යෙදවිය හැකි සියලු ඉඩම් හා රජයේ ආයතන සතු ඉඩම් සංවර්ධනය කොට ජාතික ආර්ථිකය ශක්තිමත් කිරිමට දායක කර ගැනීම සහතික කිරිම සඳහා රජයේ ඉඩම් කළමණාකරණය හා සම්බන්ධ සියලු පාර්ශව සහ සෙසු වෙනත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණයෙන් ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාවට නැගීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ.ඒ සඳහා පහත දක්වා ඇති ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී ක්‍රියාකිරිම අපේක්ෂා කෙරේ.

01. බලපත්‍ර මත බැහැර කර ඇති එක් එක් ග්‍රාම නිලධාරි වසමේ ඇති සියලු ඉඩම් කච්චි පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරි සතුව ඇති බව තහවුරු කර ගැනීම හා එසේ තොරතුරු නොමැති වසම් වල ග්‍රාම නිලධාරින් ඒ සඳහා යොමු කීරීම.
02. අදාල කෘෂිකාර්මික කටයුතු සඳහා බැහැර කර ඇති ඉඩම් හා සෙසු ඉඩම්වල නේවාසික හෝ වාණිජ කටයුතුවලට අනුමත පරිදි යොදා ගැනීමෙන් ඉතිරිවන සියලු බිම් කොටස් කෙටිකාලීන ආහාර භෝගවලට ප්‍රමුඛතාවක් ලබා දෙමින්, සුදුසු පරිදි කෙටිකාලීන ආහාර භෝග හෝ වාණිජ භෝග වගාව සඳහා අදාල ඉඩම් හිමියන් නැඹුරු කිරීම සඳහා ඔබ දැනටමත් අධීක්ෂණය කොට මෙහෙය වනු ලබන කෘෂිකර්ම කමිටුව සම්බන්ධ නිලධාරීන්ද ඇතුළුව ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්ගේ මෙහෙය වීමෙන් යුතු යාන්ත්‍රණයක් සැකසීම. දැනටමත් යම් කොට්ඨාස කිහිපයක මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බවද වාර්තා වීම අගය කරමි.
03. ඉහත කී බැහැර කර ඇති ඉඩම් ලබා දී ඇති නිශ්චිත අරමුණු සඳහා යොදා ගෙන තිබේ දැයි ග්‍රාම නිලධාරි මගින් පරීක්ෂා කොට තොරතුරු ලබා ගෙන එසේ නොමැති ඉඩම් පිළිබඳ ලැබෙන තොරතුරු අනුව පළමුව ලිඛිතව දැනුම් දීමක් මගින් අදාළ බලපත්‍ර කරුට එම ඉඩම් සංවර්ධන කාර්ය සඳහා යොදවන ලෙස දැනුවත් කොට එයට ද අවධානය යොමු නොකළහොත් නැවත කාර්යාලයට කැඳවා ප්‍රාදේශීය ලේකම් /සහකාර ප්‍රාදේශීය ලේකම් අභිමුඛයේ කරුණු පහදා දී නියමිත කාර්ය සඳහා බලපත්‍රකරුවන් යොමු කිරීම.
04. අංක 3 යටතේ දක්වා ඇති පරිදි දැනුවත් කිරීමෙන් පසුවත් අදාල බලපත්‍රකරු නිසි අවදානයෙන් ක්‍රියා නොකරන්නේ නම් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 106,109 වගන්ති ප්‍රකාරව ක්‍රියා කිරීම.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

05. දැනටමත් කිසියම් සංවර්ධන කටයුත්තක් සඳහා යොදා ගෙන නොමැති එහෙත් කෙටි කාලින/දීර්ඝ කාලින පදනමෙන් කෘෂි කාර්මික සංවර්ධන කටයුතු සඳහා බැහැර කළ හැකි ඉඩම් හඳුනා ගෙන රජයේ ඉඩම් අඥා පනතේ හා ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධි විධාන අනුව සුදුස්සන් සඳහා එම ඉඩම් පවරා දී සංවර්ධනය සඳහා යොමු කිරීම

06. දැනටමත් රජයේ පාසල් හා රාජ්‍ය ආයතන වෙත පවරා දී ඇති එහෙත් සංවර්ධන කාර්ය සඳහා යෙදවිය හැකි හිස් ඉඩම් එම ආයතනයේ සංවර්ධන සමිති /සුබසාධක සමිති/ආදිශිෂ්‍ය සමිති/ශිෂ්‍ය සමිති මඟින් සෘජුව හෝ අධීක්ෂණය යටතේ කෙටි කාලීන වගාවන් සඳහා යෙදවීමෙන් සංවර්ධනය අපේක්ෂා කරන අතර එවැනි ඉඩම් සඳහා 2021/06 අංක දරණ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව සුදුසු තක්සේරුවක් මත එළදා බදු අය කිරීමටත්, ඒ සඳහා ඉ.කො 78 බලපත්‍රයක් නිකුත් කිරීමටත් කටයුතු කළ යුතු ය.

07. මෙම ඉඩම්, සංවර්ධන කාර්ය සඳහා නිශ්චිත තොරතුරු කඩිනමින් ලබා ගැනීමටත්, එම තොරතුරු මත පදනම්ව අදාල ඉඩම් සංවර්ධනය කිරීම සඳහා අදාල කාර්ය සඳහා ජනතාව යොමු කිරීමට/අදාල ආයතන යොමු කිරීමට ග්‍රාම නිලධාරී සමග සුදුසු පරිදි ආර්ථික සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර, සමෘද්ධි සංවර්ධන නිලධාරී සහාය ලබා ගත හැකි අතර ප්‍රාදේශීය කෘෂි කර්ම කමිටුව මඟින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට හා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ උපදේශකත්වය හා මගපෙන්වීම ලබා දීම.

08. ඉහත කී ඉඩම් වලට අමතරව දීමනාපත්‍ර මත බැහැර කර ඇති හා පෞද්ගලික ඉඩම් වල හිමිකරුවන් ද හැකිතාක් දුරට දැනුවත් කොට එම ඉඩම් වල කෙටි කාලීන ආහාර බෝග හා වාණිජ බෝග වගාවට යෙදවීම සඳහා දැනුවත් කිරීම.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

පිටපත් -

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - කරු දැ.ගැ.ස. |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු දැ.ගැ.ස |
| 03. | ලේකම්,රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය | - කරු දැ.ගැ.ස |
| 04. | ලේකම් ඉඩම් අමාත්‍යාංශය | - කරු දැ.ගැ.ස. / අ.ක.ස. |
| 05. | ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය | - කරු දැ.ගැ.ස. |
| 06. | දිස්ත්‍රික් ලේකම් (ගාල්ල,මාතර,හම්බන්තොට) | - අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉඩම් දැනුවත් කිරීම සඳහා |
| 07. | ආණ්ඩුකාර ලේකම්,දකුණු පළාත | - කරු දැ.ගැ.ස. |
| 08. | පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත | - කරු දැ.ගැ.ස. . / අ.ක.ස. |
| 09. | පළාත් ඉඩම් කොමසාරිස්, දකුණු පළාත | - කරු දැ.ගැ.ස. . / අ.ක.ස. |